# ලංසු සඳහා ආරාධනයයි

# කාර්යාල පරිශ්‍රයක් බදු පදනම මත ප්‍රසම්පාදනය

## වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

1. වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය සඳහා **"කාර්යාල පරිශ්‍රයක් වසර 3 ක කාලයක් සඳහා බදු පදනම මත ප්‍රසම්පාදනය"** සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය, **ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය** තුළින් පවත්වනු ලැබේ.

3. මේ සඳහා පහත සඳහන් අවම අවශ්‍යතා සපුරාලිය යුතුය.

- **පිහිටීම :** විශේෂයෙන් කොළඹ නගර සීමා ප්‍රදේශය, බත්තරමුල්ල, රාජගිරිය ප්‍රදේශවලින්, ප්‍රධාන මාර්ගයක හෝ ප්‍රධාන මාර්ගයේ සිට දළ වශයෙන් **මීටර් 300 ක** දුරක් ඇතුළත පිහිටා තිබිය යුතුය.
- **අවශ්‍ය ඉඩකඩ :** භාවිත කළ හැකි ඉඩ පහසුකම් ප්‍රමාණය සම්පූර්ණ ටයිල් හෝ ටෙරාසෝ කළ ව. අඩි 40,000 හා 45,000 **අතර** විය යුතු අතර, වායුසමීකරණ පහසුකම් හා ලංසුලේඛනයන්හි විස්තර සඳහන් අනෙකුත් අවශ්‍ය පහසුකම් තිබිය යුතුය.
- **රථ නැවැත්වීමේ පහසුකම් :** ගොඩනැගිලි පරිශ්‍රය ඇතුළත කාර්යාල වාහන 30 - 40 අතර නවත්වා තැබීමේ පහසුකම් තිබිය යුතුය.

4. **ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 20,000/=** මුදලින් ගෙවීමෙන් කොළඹ 03, ආර්. ඒ. ද මෙල් මාවතේ, අංක 492, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ, මූල්‍ය අංශයේ "M" මහලෙන් අදාළ ලංසුලේඛන ලබාගතහැක. **අදාළ ලංසුලේඛන 2024 ජනවාරි 29 දින සිට 2024 පෙබරවාරි 15 දින දක්වා, රාජකාරී දිනවල පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ නිකුත් කරනු ලබන අතර,** www.trade.gov.lk (Downloads→Ministry Notifcations) වෙබ් අඩවියේද පළකර ඇත.

5. සියලුම ලංසු සමග, ලංසු ලේඛනයන්හි IV කොටසේ ඇතුළත් ලංසු ඇපකර ප්‍රකාශයක් තිබිය යුතුය.

6. යථා පරිදි සම්පූර්ණ කළ ලංසු **"මුල් පිටපත"** හා **"අනු පිටපත"** ලෙසට පිටපත් දෙකක් වශයෙන්, ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත එවීමෙන් හෝ "M" මහලෙහි වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිය. 2024 පෙබරවාරි 16 දින ප.ව. 3.00ට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ ලංසු බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ **"කාර්යාල පරිශ්‍රයක් බදුපදනම මත ප්‍රසම්පාදනය"** යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම එම අවස්තාවට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

7. මේ සම්බන්ධ **පූර්ව ලංසු රැස්වීමක් 2024 පෙබරවාරි 06 වන දින පෙ.ව. 10.00 ට**, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ "M" මහලේදී පැවැත්වීමට නියමිත අතර, මෙම රැස්වීමට සහභාගී වන මෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

8. මේ සම්බන්ධව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

9. වැඩිදුර තොරතුරු සඳහා, කරුණාකර, දුරකථන අංක 011-2110577 මගින් ප්‍රධාන ගණකාධිකාරී අමතන්න.

**සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය,**
**අංක 492, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03.**